RARE

# සමාජ ව්‍යුහය තුළ කුල ක්‍රමයේ සිදු වෙමින් පවතින

# වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයක්

(පැල්පොල ග්‍රාමය ආශ්‍රයෙන්)

ඩබ්. ටී.එච්. දයානන්ද

FGS/SOCI/MC/08/002

සමාජීය විද්‍යාපති සමාජ විද්‍යාව උපාධියෙහි අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

2015 මාර්තු

ප්‍රවේශ අංකය: 1240
වර්ග අංකය:

# සමාජ ව්‍යුහය තුළ කුල ක්‍රමයේ සිදු වෙමින් පවතින වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයක්

## (පැල්පොල ග්‍රාමය ඇසුරෙන්)

**නිබන්ධන සාරාංශය**

මානව ඉතිහාසයේ ප්‍රධාන මං සලකුණු සනිටුහන් කළ සමාජ ප්‍රපංචයක් ලෙස, සමාජ ස්ථරායනය සෑම සමාජයකටම අදාළ වන සහ ක්‍රියාත්මක වන සමාජ තත්වයක් බැවින් විශ්වීය ස්වභාවයකින් යුක්ත වේ. පුම්තිරිබව, වයස, පන්තිය, කුලය ආදී ස්ථරායන සාධක වර්තමාන සමාජය තුළ දක ගත හැකිය. මේ අතුරින් කුලය, දකුණු ආසියාතික සමාජ, ආර්ථික, සංස්කෘතික ප්‍රපන්චයන් තුළින් නිර්මාණය වී පෝෂණය වූ ස්ථරායන සාධකයක් බැවින් දකුණු ආසියාතික සමාජයට සුවිශේෂී වේ.

ශ්‍රී ලාංකික සමාජය තුළ කුල ක්‍රමයේ සිදු වෙමින් පවතින වෙනස්කම් පිළිබඳ කරන ලද මෙම අධ්‍යයනයේ දී සමාජ වෙනස් වීමේ ක්‍රියාවලිය තුළ කුල ක්‍රමයද වෙනස් වෙමින් පවතින බවත්, එයට අනුරූපීව ගැමි සමාජ වෙනස් වීම අධ්‍යයනයට ලක් කිරීම පර්යේෂණයේ අරමුණු විය. මෙම අරමුණු සාක්සාත් කර ගැනීම සඳහා පර්යේෂණයේ නියැදිය ලෙස බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැල්පොල ග්‍රාමය යොදාගත් අතර 1950 දශකයේ දී ඇමරිකානු ජාතික සමාජ විද්‍යාඥ මහාචාර්ය බ්‍රයිස් රයන් විසින් අධ්‍යයනය කළ පර්යේෂණ ක්ෂෙත්‍රයක් වීමද මෙම ක්ෂෙත්‍රය තෝරා ගැනීමට හේතුවක් විය.

සමාජ වෙනස්වීම නැමති ප්‍රපංචයට සම්බන්ධ මෙම පර්යේෂණය දශක හයකට පෙර සිදු කරන ලද අධ්‍යයනය සහ වර්තමාන තත්වය පිළිබඳ සසඳා බැලීමක් සිදු කරන බැවින් තුලනාත්මක ක්‍රමය සහ ඓතිහාසික ක්‍රමය පර්යේෂණ ක්‍රම ලෙස යොදා ගත් අතර දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම ලෙස නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය, සමීක්ෂණ ක්‍රමය භාවිතා කළේය. පර්යේෂණයේ ද්විතියික දත්ත අවශ්‍යතාවයන් මහාචාර්ය බ්‍රයිස් රයන්ගේ Sinhales Village ග්‍රන්ථය, සමාජ ස්ථරායනය පිළිබඳව සඳහන්ව ඇති ග්‍රන්ථ, ක්ෂෙත්‍ර නිලධාරීන්ගේ සංඛ්‍යා ලේඛන තුළින් සම්පූර්ණ කරගත් අතර ප්‍රාථමික දත්ත අවශ්‍යතාවයන් ක්ෂෙත්‍රය අධ්‍යයනය තුළින් ලබා ගත් තොරතුරු ඇසුරින් සම්පූර්ණ කර ගත්තේය.

මෙම ක්‍රමවේදයන් යොදා සිදු කරන ලද පර්යේෂණය තුළින් සිංහල කුල ක්‍රමයේ ලක්ෂණ පන්ති ක්‍රමයක ලක්ෂණ සමඟ සම්මිශ්‍රනය වූ සමාජ ව්‍යුහයක් නූතන ශ්‍රී ලාංකික සමාජය තුළ ස්ථාපිත වෙමින් පවතින බව තහවුරු විය. තවද, සාම්ප්‍රදායික සමාජය තුළ දක්නට ලැබුණු කුල ක්‍රමය සමාජ ව්‍යුහයට සමගාමීව වෙනස්වීමට භාජනය වුවද, වත්මන් සමාජ ව්‍යුහයන්ගේ සිදුවන වෙනස්වීම් වලට සාපේක්ෂව මන්දගාමීව වෙනස්වීම සිදු වන අතර සාම්ප්‍රදායික කුල කාර්යයන් තවදුරටත් ශේෂ වශයෙන් පවතින බව දක්නට ලැබුණි.

මුඛ්‍ය පද: සමාජ ස්ථරායනය, කුලය, පන්තිය, සමාජ වෙනස්වීම, ග්‍රාමීය සමාජය

# A Study of the changes that is being taking place of the caste system in social structure.

**(with reference to Palpola Village)**

**Abstract**

Social stratification has a universal nature as it is a remarkable phenomena in ethnological history which is relevant and implementing in every society. Gender, age, class and caste are some factors of the social stratification that can be seen in the contemporary society. Out of these factors caste is a special factor which has originated and feeded in the South Asian society.

This study is about the changes of the caste system that is being taking place in the Sri Lankan society. The objective of this research was to study, the changes that is being taking place in the caste system parallel to the changes of the society and accordingly the changes taking place in the Folk society.

Palpola village in Millaniya secretariat division of Kaluthara district of Western Province has selected as the research sample. Professor Bryce Ryan who was an American sociologist also studied about this field in 1950 decade. This also one reason to select this field of study.

This is a comparative study about and the former study which has done over six decades and the prevailing condition. In this research comparative method and historical method were used as the research methods.

Observation, Interviews and survey methods were used as the techniques of collecting data. Primary data were obtained through field study and secondary data were obtained by referring the relevant books and articles including Ryan's book.

It was confirmed by this research that a mixed social structure including the characteristic of caste system and social class is being establishing in the modern Sri Lankan society. And also even the caste system is being subjecting to changes parallel to the social structure; It is a slow process relative to the changes of the other social structures in present society and still remaining the characteristic of traditional caste system.

Key words: - Social stratification, caste, class, social change, Folk society.